# ශ්‍රී ලංකාවේ සසප මැතිවරන වෙබ් අඩවිය දියත් කරයි

## Sri Lankan SEP launches election web site

2010 ජනවාරි 13

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය (සසප) නව වෙබ් අඩවියක් දියත් කර තිබේ: එහි ලිපිනය http://www.socialequality.com/srilanka/index.shtml. ප්‍රථම වතාවට, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ විශ්ලේෂන දිවයිනේ ප්‍රධාන භාෂා තුනෙන්, එනම්, ඉංග්‍රීසි, සිංහල හා දෙමල භාෂාවන්ගෙන්, එකම වෙබ් අඩවියක පල කෙරෙනු ඇත.

ජනවාරි 26 දා පැවැත්වෙන ජනාධිපතිවරනය සඳහා සසප සහ එහි ජනාධිපති අපේක්ෂක සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් විසින් ගෙනයනු ලබන උද්ඝෝෂනය පිලිබඳ සම්පූර්න මාධ්‍ය ආවරනයක්, අද පටන්, මෙම වෙබ් අඩවිය මගින් සැපයෙනු ඇත. පක්ෂයේ සියලු ප්‍රතිපත්ති ප්‍රකාශන, විවරන සහ ඩයස්ගේ මැතිවරන උද්ඝෝෂනය පිලිබඳ වාර්තා මෙන් ම, රට පුරා පැවැත්වෙන සසප මැතිවරන රැස්වීම් පිලිබඳ විස්තර හා වාර්තා වෙත තනි වෙබ් අඩවියක් හරහා ප්‍රවිෂ්ට වීමේ අවස්ථාව ජාතික හා ජාත්‍යන්තර පාඨකත්වයකට ලැබෙනු ඇත.

දිවයිනේ දශක ගනනාවක් දිගු සිවිල් යුද්ධයේ දී බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පරාජය වීමෙන් පසුව, දේශපාලන හා ආර්ථික අර්බුදයේ තීරනාත්මක අවස්ථාවක දී පැවැත්වෙන, ජනාධිපතිවරනයේ දී වැඩ කරන ජනතාව වෙනුවෙන් සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කරන එකම පක්ෂය සසප ය.

දැනට බලයේ සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ විරුද්ධ පක්ෂවල අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා ප්‍රතිවාදී යුදවාදී අපේක්ෂකයෝ ය. දෙදෙනාම සාපරාධී යුද්ධය ද දෙමල සිවිල් ජනයාට එරෙහිව සිදු කෙරුනු ජනඝාතන හා මානව හිමිකම් උල්ලංඝනයන් ද සම්බන්ධයෙන් වගකිව යුතු ය. ඔවුන් අතර මූලික ක්‍රියාමාර්ගික මතභේද නැත.

රාජපක්ෂ වසර දෙකකට පෙර මැතිවරනය කැඳවූයේ, කම්කරු පන්තියට හා එහි ජීවන මට්ටම්වලට එරෙහිව "ආර්ථික යුද්ධයක්" දියත් කිරීමෙහි ලා සිය අත් ශක්තිමත් කරගනු පිනිස ය. කෙසේවෙතත්, පාලක ප්‍රභූවේ සැලකිය යුතු කොටසක්, එම පටි තද කර ගැනීමේ න්‍යාය පත්‍රය පැටවීම පිනිස වඩා ශක්තිමත් පුද්ගලයකු ලෙස ජෙනරාල් ෆොන්සේකා සලකයි.

සසප අපේක්ෂක විජේ ඩයස් වැඩ කරන ජනතාව සඳහා පවතින එකම විසඳුම වෙනුවෙන් සටන් වදියි: එනම්, දකුනු ආසියාවේ හා ජාත්‍යන්තර පරිමානව සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක රූපයෙන් කම්කරු-ගොවි ආන්ඩුවකි.

ජනාධිපතිවරනයෙන් පසුව, නව වෙබ් අඩවිය, ලෝක සමාජවාදී වෙබ් අඩවිය හරහා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සම්පාදනය කරන දෛනික මාක්ස්වාදී විශ්ලේෂන වර්ධනය කිරීම සහ ඒවා එක විට භාෂා තුනෙන් ම ඉදිරිපත් කිරීම දිගටම කරගෙන යනු ඇත.

සියලු දෙනා සඳහා පහසු ප්‍රවිෂ්ටයක් සපයනු වස්, මෙම වෙබ් අඩවිය යුනිකෝඩ් තාක්ෂනය යොදාගනී. ආරම්භයේ දී සමහර පාඨකයන්ට සිංහල හෝ දෙමල පාඨ කියවීම පිනිස සිය පරිගනකයේ පද්ධතිය වැඩිදියුනු කරගැනීමට සිදු වනු ඇත. පහත සඳහන් සබැඳිය මගින් අදාල වෙබ් අඩවියට පිවිස එහි සඳහන් උපදෙස් අනුගමනය කිරීමෙන් එය පහසුවෙන් කරගත හැකි ය.

සිංහල: http://www.siyabas.lk/sinhala_how_to_install.html

දෙමල: http://www.siyabas.lk/tamil_how_to_install_in_english.html

විජේ ඩයස්ගේ මැතිවරන උද්ඝෝෂනය පිලිබඳ වැඩි විස්තර දැනගැනීම ද අප පක්ෂයේ විවරන හා ප්‍රතිපත්ති ගැන සමීප ඥානයක් ලබාගැනීම ද පිනිස නව වෙබ් අඩවිය වෙත පිවිසෙන ලෙස කම්කරුවන්ට, තරුනයන්ට හා බුද්ධිමතුන්ට සසප ආරාධනා කර සිටී.

© www.wsws.org